# 2025 වර්ෂය ආදායම් උත්පාදනයෙන් වැඩි ප්‍රමාණයක් මෝටර් රථ ආනයනයෙන් අපේක්ෂා කරනවා

**29. අලි-මිනිස් ගැටුම් අවම කිරීම සහ වන සංරක්ෂණය**

වනඅලින්ගෙන් සිදු වන භෝග හානි, දේපළ විනාශය සහ ජීවිත හානි අවම කිරීම සඳහා පියවර කිහිපයක් ක්‍රියාත්මක කර ඇත. මේ සඳහා කිලෝමීටර් 5,611 ක පමණ විදුලි වැටවල් වැඩිදියුණු කිරීම ඇතුළත් වන අතර, ප්‍රතිසංස්කරණය සඳහා කිලෝමීටර් 1,456 ක් හඳුනාගෙන ඇත. මීට අමතරව, වැට දිගේ ආරක්ෂක කණු ඉදිකර අවශ්‍ය උපකරණ මිලදී ගනු ලැබේ. මීට අමතරව ආක්‍රමණශීලි ශාක ඉවත් කිරීම, වඩා හොඳ තණබිම් කළමනාකරණය සහ වැඩිදියුණු කළ ජල මූලාශ්‍ර හරහා අලි වාසස්ථාන වැඩිදියුණු කරනු ලැබේ. මෙම උත්සාහයන් සඳහා රුපියල් මිලියන 300 ක් දැනටමත් අය වැය තුළ වෙන් කර තිබෙනවා.

තවද, වනජීවී කලාප කාර්යාල, ආරක්ෂක කාර්යාල සහ බීට්ටු නිලධාරීන් ඇතුළු කාර්යාල 270ක ධාරිතාව වැඩිදියුණු කිරීම සඳහා රුපියල් මිලියන 100ක් වෙන් කර තිබෙනවා. මෙම අරමුදල් විදුලි වැට නඩත්තු කිරීම, වාහන සහ බෝට්ටු නඩත්තු කිරීම, වනජීවී අපරාධ වැළැක්වීම සහ අලි-මිනිස් ගැටුම අවම කිරීම සඳහා වන සමස්ත උත්සාහයන් සඳහා සහාය වනු ඇත. එවැනි ගැටුම්වලට ගොදුරු වූවන් සඳහා වන්දි වශයෙන් අතිරේක රුපියල් මිලියන 240 ක් වෙන් කර ඇති අතර, අලි-මිනිස් ගැටුම අවම කිරීම සඳහා වන මුළු අය වැය රුපියල් මිලියන 640 දක්වා වැඩි කර තිබෙනවා. එපමණක් නොව, ස්වාභාවික පුනර්ජනනය ප්‍රවර්ධනය කිරීම සහ වන විනාශය ආමන්ත්‍රණය කිරීම සඳහා රුපියල් මිලියන 1,050ක් වෙන් කර තිබෙනවා. මෙම අරමුදල් නැවත වන වගා ප්‍රයත්න, වන සංරක්ෂණ මුලපිරීම්, වාණිජ වන වගා ව්‍යාප්තිය, පාරිසරික ආරක්ෂාව සහ කඩොලාන කළමනාකරණයට සහාය වනු ඇත. එය පරිසර හිතකාමී සංචාරක ව්‍යාපාරයට පහසුකම් සැලසීම, වන ආවරණය වැඩි කිරීම, ලැව් ගිනි අවම කිරීම සහ වනාන්තර ආශ්‍රිත අපරාධ වැළැක්වීම සඳහා ද කටයුතු කිරීමට අපේක්ෂා කරනවා.

**30. තිරසර මූල්‍යකරණය**

පාරිසරික, සමාජ සහ පාලන යන ක්ෂේත්‍ර මත පදනම් වූ මූල්‍යකරණයේ සමෘද්ධිමත් පරිසර පද්ධතියක් පෝෂණය කිරීම සඳහා රජය තිරසර මූල්‍යකරණයේ අවස්ථා ප්‍රයෝජනයට ගනු ඇත. දේශගුණික විපර්යාස සඳහා වන මූලික ක්‍රියාමාර්ගයන් සහ ඒ ආශ්‍රිත ප්‍රයත්නවලට සම්බන්ධ ගෝලීය වශයෙන් පවතින තිරසර මූල්‍ය සංචිත වෙත ප්‍රවේශ වීමට පරිසර අමාත්‍යාංශය, මුදල් අමාත්‍යාංශය සහ මහ බැංකුව සමඟ එකිනෙක සම්බන්ධීකරණයෙන් යුතුව කටයුතු කරනු ඇත.

**31. මූල්‍ය වෙළෙඳපොළ සංවර්ධනය**

ශ්‍රී ලංකාව ආර්ථික අර්බුදයෙන් ක්‍රමයෙන් මිදීමත් සමඟ, මූල්‍ය අංශයේ ක්‍රියාකාරිත්වයද පැවති පීඩාකාරී තත්ත්වයෙන් මිදී සාමාන්‍ය තත්ත්වයට පත් වෙමින් සිටී. මූර්ත ආර්ථිකයේ වර්ධනය සඳහා උපකාරී විය හැකි ලෙස ස්ථානගත වන ආකාරයට මූල්‍ය වෙළෙඳපොළ සංවර්ධනය කිරීම සඳහා දැන් කාලය එළැඹ ඇත. ප්‍රාග්ධන වෙළෙඳපොළ උචිත පරිදි නව අංගයන් හා උපකරණ සහිතව තාක්ෂණය මුසුකර ගනිමින් සංවර්ධනය කිරීම සහ පුළුල් කිරීම අවශ්‍ය වී තිබේ. රජය පෞද්ගලික අංශයේ සහ රාජ්‍ය ආයතන සඳහා අවශ්‍ය හිමිකාරීත්ව ප්‍රාග්ධනය සහ ණය ප්‍රාග්ධනය සම්පාදනය කරගැනීමට ආයතන උනන්දු කරවීම සඳහා රජය ක්‍රියාකාරීව අවශ්‍ය කටයුතු සූදානම් කරනු ඇත.

බැංකු පොලී අනුපාතික පහත වැටෙන විට, සුළු පරිමාණ ආයෝජකයන්ට සාධාරණ ප්‍රතිලාභයක් ලැබෙන සුදුසු නිසි ලෙස නියාමනයට ලක් වූ මූල්‍ය උපකරණ තුළ ආයෝජනය කිරීමේ ප්‍රවේශය තිබීම වැදගත් වේ. භාර අරමුදල්, ආයෝජන අරමුදල් සහ අනෙක් සමූහ ආයෝජන ක්‍රමවේද මේ වෙනුවෙන් භාවිත කිරීම පහසු කරවීම තුළින් මූල්‍ය වෙළෙඳපොළේ ඇති හිඩැස් පිරවිය හැක. මේ සඳහා නවෝත්පාදන ක්‍රමවේද සහ සංකීර්ණ ගනුදෙනු කළ හැකි ක්‍රමවේද නිසි සුපරීක්ෂාවෙන් යුක්තව සහ අදාළ ආරක්ෂණ ක්‍රමවේදවලට අනුකූලව, ඵලදායී නියාමන පරිසරයක් තුළ සිදු කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන සපයනු ලැබේ.

**32. පාලන ප්‍රතිසංස්කරණ**

ආර්ථික ප්‍රගතියට ප්‍රධාන බාධාවක් වන්නේ දූෂණයයි. එබැවින්, සාමූහික උත්සාහයක් ලෙස රටේ තිරසර ආර්ථික සංවර්ධනයට බාධා කරන ලෙස ව්‍යාප්ත වන දූෂණයට විසඳුම් සෙවීමේ හදිසි අවශ්‍යතාවයක් පවතී. මෙම සන්දර්භය තුළ, රජයේ නිලධාරීන් පමණක් නොව, පෞද්ගලික අංශයේ පුද්ගලයින් සහ සෑම පුරවැසියෙකුම දූෂණය පැවතීමට අදාළව ඔවුන්ගේ දයකත්වයක් ඇත්නම් එය පිළිගත යුතුය. දූෂණය පිටුදැකීම සඳහා අවශ්‍ය නීතිමය රාමුව තවදුරටත් ශක්තිමත් කරනු ලැබේ. ශ්‍රී ලංකාවේ පාලනය, විනිවිදභාවය සහ වගවීම ශක්තිමත් කිරීම සඳහා දූෂණ විරෝධී මුලපිරීම් මෙහෙයවීම සඳහා ජාත්‍යන්තර ආයතනවල සහාය ද ඇතිව ප්‍රසාරණය වන මූල්‍ය සහ අනෙකුත් සහයෝගය සමඟ අපරාධ ආදායම පිළිබඳ පනත් කෙටුම්පත බලාත්මක කිරීම සහ අල්ලස් හා දූෂණ චෝදනා විමර්ශන කොමිසම (CIABOC) තවදුරටත් ශක්තිමත් කිරීම කඩිනම් කරනු ලැබේ. එපමණක් නොව, සහයෝගී කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලියකින් පසු දැනට කෙටුම්පත් අදියරේ පවතින අපරාධ ආදායම පිළිබඳ නීති සමාලෝචනය කර ක්‍රියාත්මක කිරීමට අප අපේක්ෂා කරනවා.

**33. ශ්‍රී ලාංකික දිනය**

"පොහොසත් රටක්- ලස්සන ජීවිතයක්" යන රජයේ ප්‍රතිපත්ති රාමුව, ප්‍රජාවන් අතර පරතරයන් පියවීමට කැපවී, සංහිඳියාවෙන් යුත් ශ්‍රී ලංකාවක් සඳහා දැක්මක් ඉදිරිපත් කරයි. එබැවින්, "ශ්‍රී ලාංකික දිනය" ජාතික උත්සවය පැවැත්වීමට මා යෝජනා කරනවා. මෙම උත්සවය පෞද්ගලික අංශයේ ද සහභාගිත්වයෙන් සංවිධානය කෙරේ. මේ සඳහා රුපියල් මිලියන 300 ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා.

**34. අභ්‍යන්තරව අවතැන් වූවන් සඳහා නිවාස**

සංහිඳියා මුලපිරීම් සහ ඉඩම් නිදහස් කිරීමත් සමඟ, අභ්‍යන්තරව අවතැන් වූ ජනතාව (අභ්‍යන්තරව අවතැන් වූවන්) නැවත පදිංචි කරවනු ලබන අතර, ගැටුමෙන් පසු නැවත පදිංචි කිරීම සඳහා සරණාගතයින් උතුරු සහ නැඟෙනහිර පළාත්වලට නැවත පැමිණෙමින් සිටිනවා. කෙසේ වෙතත්, නැවත පදිංචි කරන ලද පවුල්වල මූලික යටිතල පහසුකම් සහ උපයෝගිතා තවමත් ඉටු කර නැහැ.

ඒ අනුව, උතුරු සහ නැඟෙනහිර ජනතාව මුහුණ දෙන ප්‍රධාන ගැටලු විසඳීම සඳහා බහුවිධ උපාය මාර්ගයක් ආරම්භ කිරීමට අප යෝජනා කරනවා. 2025 අය වැයෙන්, මෙම ජනතාව නැවත පදිංචි කිරීමේ අවශ්‍යතා සපුරාලීමට සහ නිවාස වැඩසටහන වේගවත් කිරීමට සහ වර්තමාන අවශ්‍යතාවය මත පදනම්ව නිවාස නොමැති පවුල්වලට අත්‍යවශ්‍ය සහන ලබා දීමට රුපියල් මිලියන 1,500 ක් වෙන් කර තිබෙනවා.



**35. රජය විසින් ඉදිකරන ලද මහල් නිවාස සඳහා අත්‍යවශ්‍ය නඩත්තු**

නඩත්තු නොමැතිකම සහ අවභාවිතය හේතුවෙන් මහල් නිවාසවල භෞතික තත්ත්වය දුර්වල වී තිබෙනවා. මෙම සියලු ගොඩනැගිලිවල බාහිර මුහුණතේ ඉරිතැළීම්, විඛාදන සහ ජලය කාන්දු වැනි බොහෝ භෞතික දෝෂ තිබෙනවා. මධ්‍යම රජය විසින් ඉදිකරන ලද මහල් නිවාස සංකීර්ණවල අත්‍යවශ්‍ය නඩත්තුව සඳහා රුපියල් මිලියන 1,000 ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා.

**36. කලාකරුවන් / මාධ්‍යවේදීන් සඳහා නිවාස**

මහජන චීන සමූහාණ්ඩුවේ ආධාර ඇතිව නිවාස ඒකක 1,996 ක් ඉදිකරමින් පවතී. මේ තුළ අප සමාජයේ සංස්කෘතික සුපෝෂණයට විශේෂ දායකත්වයක් සපයන කලාකරුවන් සහ මාධ්‍යවේදීන් සඳහා නිවාස ඒකක 108 කින් සමන්විත මහල් නිවාස සංකීර්ණයක් කොට්ටාව, පලතුරුවත්ත ප්‍රදේශයෙන් වෙන් කෙරේ.




**37. පානීය ජල අංශය**

● දැනට ක්‍රියාත්මක වන මහා පරිමාණ ජල යෝජනා ක්‍රම සහ ප්‍රජා ජල ව්‍යාපෘති කඩිනමින් නිම කිරීම.

ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය සහ ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන නළ මාර්ග පානීය ජල ආවරණය රටේ ජනගහනයෙන් සියයට 62 ක් පමණ ප්‍රමාණයක් ආවරණය කරයි. ආරක්ෂිත ජල සැපයුම සහතික කිරීමේ ජාතික වැදගත්කම හඳුනා ගනිමින්, ගම්පහ, අත්තනගල්ල සහ මිනුවන්ගොඩ ඒකාබද්ධ ජල සැපයුම් ව්‍යාපෘතිය, අලුත්ගම, මතුගම සහ අගලවත්ත ඒකාබද්ධ ජල සැපයුම් ව්‍යාපෘතිය, පොල්ගහවෙල, අලව්ව සහ පොතුහැර ඒකාබද්ධ ජල සැපයුම් ව්‍යාපෘතිය සහ ආර්ථික අර්බුදය සහ අදාළ ණය දෙන්නන් විසින් ණය පහසුකම් අත්හිටුවීම හේතුවෙන් නිම කිරීම ප්‍රමාද වී ඇති තඹුත්තේගම ජල සැපයුම් ව්‍යාපෘතිය කඩිනමින් නිම කිරීම සඳහා අය වැය ප්‍රතිපාදන ලබාදෙනු ලැබේ. පවත්නා මූල්‍ය අවකාශය තුළ හිඳිමින් වසර දෙකක කාලයක් තුළ රුපියල් මිලියන 41,234 ක් වූ අරමුදල් අවශ්‍යතාවය රජය විසින් සපයනු ඇත. ඒ අනුව, ඉහත ප්‍රමුඛතා ව්‍යාපෘති නිම කිරීම සඳහා 2025 වර්ෂය සඳහා වන ජාතික අය වැයට රුපියල් මිලියන 20,000 ක් දැනටමත් ඇතුළත් කර ඇත.

● ප්‍රජා ජලසම්පාදන යෝජනා ක්‍රමය දීර්ඝ කිරීම

විශේෂයෙන්ම නළ ජල ආවරණය සීමා සහිත ග්‍රාමීය ප්‍රදේශවල ප්‍රජා මූලික ජලසම්පාදන යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය අප අවබෝධ කරගෙන තිබෙනවා. උතුරු ප්‍රදේශය සහ නිදන්ගත වකුගඩු රෝගයේ බලපෑමට ලක් වූ ප්‍රදේශ ඇතුළුව ජලය හිඟකමින් දුෂ්කරතා ඇති ප්‍රදේශවල අවදානම් තුරන් කිරීම මඟින් ග්‍රාමීය ජීවිතයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා, සම්පූර්ණයෙන්ම පිරිපහදු කළ පානීය ජලය සැපයීම සඳහා ප්‍රජා මූලික ග්‍රාමීය ජලසම්පාදන යෝජනා ක්‍රම එවැනි ප්‍රදේශවල ව්‍යාප්ත කිරීමේ වැදගත්කම අප හඳුනාගෙන තියෙනවා.

ඒ අනුව, 2025 වසර සඳහා ප්‍රජා ජලසම්පාදන දෙපාර්තමේන්තුව යටතේ අය වැය ඇස්තමේන්තුවලින් වෙන් කර ඇති රුපියල් මිලියන 2,000 දැනටමත් ආරම්භ කර ඇති ප්‍රජා ජලසම්පාදන යෝජනා ක්‍රම අවසන් කිරීමටත්, නව ප්‍රජා ජල යෝජනා ක්‍රම ආරම්භ කිරීමටත් යෙදවීමට අප යෝජනා කරනවා.

● **ගිරිබාව - එප්පාවල ජල යෝජනා ක්‍රමය නැවත ආරම්භ කිරීම**

උතුරුමැද පළාතට අයත් ගිරිබාව සහ එප්පාවල ප්‍රදේශ වියළි කලාපයක පැවතීම නිසා ගුණාත්මක පානීය ජලය ලබා ගැනීමේ දුෂ්කරතාවන්ට මුහුණදීමට සිදුව ඇති අතර, එමඟින් එම ප්‍රදේශයේ ජනතාවට විවිධ අවදානම් තත්ත්වයන්ට මුහුණ දීමට සිදුව තිබේ. කලාඔය හරහා කලා වැවෙන් පෝෂණය වන රාජාංගණය වැවෙන් ගිරිබාව සහ එප්පාවල ප්‍රදේශයට මතුපිට ජල මූලාශ්‍රවලින් පානීය ජලය ලබාදීමේ වැදගත්කම අප හඳුනාගෙන තියෙනවා. ඒ සඳහා ප්‍රදේශයට නළ ජලය සැපයීම පිණිස ගිරිබාව - එප්පාවල ජලසම්පාදන යෝජනා ක්‍රමයේ මූලික කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා රුපියල් මිලියන 1,000 ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා.

**38. රාජ්‍ය සේවයේ අත්‍යවශ්‍ය පුරප්පාඩු පිරවීම**

රාජ්‍ය අංශය දේශපාලනඥයින්ගේ ආධාරකරුවන්ගෙන් පුරවා ගැනීමේ අතීත පුරුද්ද අප නතර කර තිබෙනවා. රජයේ දැක්මට අනුකූලව රාජ්‍ය අංශයේ බඳවා ගැනීම්, උසස්වීම් සහ ස්ථාන මාරුවීම් දේශපාලන බලපෑම්වලින් තොර සුදුසුකම් සහ කුසලතා මත පදනම්ව සිදු කිරීමට කටයුතු කරනවා.

කොවිඩ්-19 වසංගතය, ආර්ථික පසුබෑම සහ දේශපාලන අස්ථාවරත්වය විසින් එල්ල කරන ලද අභියෝග හේතුවෙන් විශාල රැකියා විරහිත උපාධිධාරී හා තරුණ පිරිසක් බිහි වී සිටී. රාජ්‍ය අංශයේ අත්‍යවශ්‍ය පුරප්පාඩු සඳහා 30,000 ක් බඳවා ගැනීමේ සැලැස්මක් ක්‍රියාත්මක කරනවා. ඒ අනුව, 2025 වසරේ දී මේ සඳහා රුපියල් මිලියන 10,000 ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා.

**39. රාජ්‍ය අංශයේ වැටුප් වැඩි වීම**

රාජ්‍ය සේවයේ මූලික වැටුප් සංශෝධනයක් සිදු කොට දශකයකට ආසන්න කාලයක් ගතවී ඇති හෙයින්, සියලු සාධක සමස්තයක් ලෙස තක්සේරු කර, වැටුප් ව්‍යුහය සංශෝධනය කිරීමට දැන් කාලය පැමිණ තිබේ. රාජ්‍ය අංශයේ සේවකයන්ට යහපත් ජීවන තත්ත්වයක් ලබාදීම අවශ්‍ය වන අතර, රජයට දක්ෂ හා පුහුණු ශ්‍රමිකයන් ආකර්ෂණය කර ගැනීමට හැකිවන අතරම අය වැය මත අධික බරක් පැටවීම වළක්වාගත යුතුය.

ඒ අනුව, අවම මාසික මූලික වැටුප රුපියල් 24,250 සිට රුපියල් 40,000 දක්වා රුපියල් 15,750 කින් වැඩි කිරීමට අප යෝජනා කරනවා. දැනට පවතින තාවකාලික අතුරු දීමනාව සහ විශේෂ දීමනාව මූලික වැටුපට ඒකාබද්ධ කරන අතර, රුපියල් 8,250 ක ශුද්ධ වැඩි වීමක් මූලික අවම වැටුපට අදාළව සිදු කිරීමට යෝජනා කරනවා.

රාජ්‍ය අංශයේ සේවකයන්ගේ වැටුප් වැඩි වීමට සමගාමීව අධිකරණ සේවා, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, විශ්වවිද්‍යාල කාර්යමණ්ඩල සහ ත්‍රිවිධ හමුදා නිලධාරීන් සඳහා ද මෙය අදාළ වේ.

රුපියල් 15,750 ක අවම මාසික මූලික වැටුප් වැඩි වීමට අමතරව වාර්ෂික වැටුප් වර්ධකයේ වටිනාකම සියයට 80 කින් ඉහළ නැංවීමට යෝජිතය. ඒ අනුව, රුපියල් 250 ක අවම වාර්ෂික වැටුප් වර්ධකය රුපියල් 450 දක්වා ඉහළ යනු ඇත. රාජ්‍ය අංශයේ සියලුම සේවකයන්ගේ වාර්ෂික වැටුප් වර්ධකය එම ප්‍රතිශතයට ගැළපීමට ද යෝජිතය.

මෙම වැටුප් වැඩි වීමේ සමස්ත ඇස්තමේන්තුගත වියදම රුපියල් බිලියන 325 ක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. පවතින රාජ්‍ය මූල්‍ය බාධාවන් සැලකිල්ලට ගනිමින් මෙම වැටුප් වැඩි වීම අදියර වශයෙන් ක්‍රියාත්මක කිරීමට යෝජනා කරනවා. මුළු ශුද්ධ වැටුප් වැඩි වීමෙන් රුපියල් 5,000ක් සහ ඉතිරි මුදලින් සියයට 30 ක් 2025 වසරේ අප්‍රේල් මාසයේ සිට ගෙවනු ලබන අතර, ඉතිරි සියයට 70, 2026 වසරේ ජනවාරි සහ 2027 වසරේ ජනවාරි මාසවලදී සමාන කොටස් වශයෙන් ගෙවනවා.

එබැවින්, 2025 වසරේ දී යෝජිත වැටුප් වැඩි වීම සඳහා රුපියල් බිලියන 110 ක් වෙන් කිරීමට යෝජනා කරනවා.

> **ආර්ථික ප්‍රගතියට ප්‍රධාන බාධාවක් වන්නේ දූෂණයයි. සාමූහික උත්සාහයක් ලෙස රටේ තිරසර ආර්ථික සංවර්ධනයට බාධා කරන දූෂණයට විසඳුම් සෙවීම හදිසි අවශ්‍යතාවක්**

මෙම වැටුප් වැඩි වීමේ කොටසක් ලෙස, යෝජිත 2025 වැටුප් ක්‍රමය යටතේ විශ්‍රාම ප්‍රතිලාභ ලැබෙන බව සහතික කරමින්, 2025 ජනවාරි මස 1 වැනිදා හෝ ඉන් පසුව විශ්‍රාම යන නිලධාරින්ගේ විශ්‍රාම ප්‍රතිලාභ නව වැටුප් ව්‍යුහය මත ගණනය කිරීමට යෝජනා කරනවා.

රාජ්‍ය සේවකයින්ගේ අවම මූලික වැටුප වැඩි කිරීම සලකා බැලීමේදී රාජ්‍ය සේවකයින්ගේ ආපදා ණය සීමාව දැනට පවතින රුපියල් 250,000 සිට රුපියල් 400,000 දක්වා ඉහළ නංවනවා. වැටුප් වැඩි වීම පිළිබඳ වැඩිදුර විස්තර ඇමුණුම V තාක්ෂණික සටහනෙහි දක්වා තිබෙනවා.

**40. පෞද්ගලික අංශයේ වැටුප් වැඩි කිරීම**

පෞද්ගලික අංශයේ සේවකයන්ගේ දැනට පවතින අවම මාසික වැටුප රුපියල් 21,000 සිට 2025 වසරේ අප්‍රේල් මස රුපියල් 27,000 ක් ලෙස සහ 2026 වසරේ සිට රුපියල් 30,000 ලෙස ඉහළ නැංවීමට සේවා යෝජකයන්ගේ සංගමය (Employers' Association) එකඟ වෙලා තිබෙනවා.

**41. වතු කම්කරුවන්ගේ වැටුප් නැවත සලකා බැලීම**

ප්‍රධාන වශයෙන් තේ, රබර් සහ පොල් යන ක්ෂේත්‍රයේ නියැළෙන වතු කම්කරුවන් මිලියන 1.5 කට ආසන්න සංඛ්‍යාවක් සිටිනවා. ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කළ යුතු බව රජයේ අදහසයි. වතුකරයේ සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කර ඇති වැඩසටහන්වලට අමතරව, දැනට යෝජිත රුපියල් 1,700 ක වැටුප ලබාදීම සඳහා රජය මැදිහත් වේ.

**42. රාජ්‍ය අංශයේ විශ්‍රාම වැටුප්**

විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප මේ වන විටත් රුපියල් 3,000ක් අප විසින් ජනාධිපතිවරණය ජයගත් විගසම වැඩි කොට තිබෙනවා. 2017.12.31 දක්වා විශ්‍රාම ගිය සියලුම විශ්‍රාමිකයන් එකම වැටුප් පරිමාණයක සිටින බැවින්, 2016 - 2020 දක්වා විශ්‍රාම ගිය රජයේ සේවකයින්ගේ විශ්‍රාම වැටුප් පමණක් සංශෝධනය කිරීම තුළින් වැටුප් විෂමතාවයක් ඇති වන බව අප නිරීක්ෂණය කරනවා.

මෙම ගැටලුව දිගු කලක් තිස්සේ නොවිසඳී පවතින බැවින්, පවතින සීමිත මූල්‍ය අවකාශය තුළ එය අදියර වශයෙන් විසඳාගත යුතු බව අප විශ්වාස කරනවා. එනිසා, 2020.01.01 දිනට පෙර විශ්‍රාම ගිය සියලුම විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප්, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 අනුව 2020 වසරට අදාළ වැටුප් පරිමාණයන්ට අනුරූපව අදියර තුනකින් සංශෝධනය කිරීමට අප යෝජනා කරනවා.

පළමු අදියර ලෙස, 2018.01.01 දිනට පෙර විශ්‍රාම ගිය සියලුම විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප්, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි 2018 වසරට අදාළ තුන්වන අදියර වැටුප් පරිමාණයන්ට අනුකූලව සංශෝධනය කරනු ලබන අතර, එය 2025 ජූලි මාසයේ සිට ක්‍රියාත්මක කිරීමට නියමිතයි. මෙම අදියර සඳහා, 2025 අය වැය හරහා රුපියල් මිලියන 10,000 ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා.

තවද, වැටුප් පරිවර්තනයේ සිවුවන සහ පස්වන අදියරවලට අදාළ විශ්‍රාම වැටුප් පරිවර්තනයන් පිළිවෙළින් 2026 ජූලි සහ 2027 ජූලි මාසවල සිට ක්‍රියාත්මක කිරීමට ද අප යෝජනා කරනවා.

**43. නීති ප්‍රතිසංස්කරණ**

ඉදිරි වසර තුළ රජය විසින්, වේගවත් ආර්ථික සංවර්ධනය, යහපත් ආණ්ඩුකරණය සහ ඵලදායී රාජ්‍ය සේවා සැපයීම ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් ශක්තිමත් නීතිමය විධිවිධාන ස්ථාපිත කිරීම සඳහා නීති ප්‍රතිසංස්කරණ ගණනාවක් හඳුන්වා දීමට අපේක්ෂා කරනවා. මෙම නීති අතරට, රාජ්‍ය ව්‍යවසායන්හි පාලනය වැඩිදියුණු කිරීම, රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් සඳහා නීතිමය රාමුවක් නිර්මාණය කිරීම, ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් වූ පාලනය වැඩි දියුණු කිරීම, රාජ්‍ය වත්කම් කළමනාකරණය, සංඛ්‍යාලේඛන, දත්ත හුවමාරුව, තක්සේරු කිරීම, වත්කම් කළමනාකරණය, ක්ෂුද්‍ර මූල්‍ය සහ ණය සහ මුදල් විශුද්ධිකරණයට එරෙහි වීම සහ ත්‍රස්තවාදී මූල්‍යකරණය යනාදිය ඇතුළත් වේ. මෙම නීති පිළිබඳ වැඩි විස්තර අය වැයෙහි ඇමුණුම VIII මඟින් දක්වා ඇත.

**44. ආදායම් ක්‍රියාමාර්ග**

ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩසටහනට පදනම වී ඇත්තේ, ආදායම මූලික කරගත් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවයයි. ආර්ථික අර්බුදයට මඟ පාදා දෙමින්, රජයේ බදු ආදායම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 7.3 ක් වූ ලෝකයේ අඩුම මට්ටමක් 2022 වසරේ දී ශ්‍රී ලංකාවේ වාර්තා වුණා.

2025 වර්ෂය සඳහා, ආදායම් උත්පාදනයෙන් වැඩි ප්‍රමාණයක් 2025 පෙබරවාරි 1 වන දින සිදු වූ මෝටර් රථ ආනයන ලිහිල්කරණය මඟින් ලබා දෙනු ඇතැයි අපේක්ෂා කරනවා. වාහන ආනයනය විදේශ අංශයේ ස්ථාවරත්වයට අනවශ්‍ය සෘණාත්මක බලපෑම් ඇති නොවන බව සහතික කිරීම සඳහා මෙම ක්‍රියාවලිය සැලකිලිමත් ලෙස අධීක්ෂණය කිරීම අවශ්‍ය වනවා. 2024 දෙසැම්බර් මාසයේ දී පාර්ලිමේන්තුවේ දී දැනටමත් ප්‍රකාශයට පත් කර ඇති අනෙකුත් ප්‍රධාන ආදායම් පියවර අතරට, පෞද්ගලික ආදායම් බද්ද සඳහා බදු රහිත සීමාව වැඩි කිරීම, දෙවන ආදායම් බදු ස්තරයට තවදුරටත් ගැළපීම් සිදු කිරීම, නැවුම් කිරි සහ යෝගට් සඳහා වැට් බද්ද ඉවත් කිරීම යනාදිය ඇතුළත් වේ. පෙර ආණ්ඩුව විසින් එකඟ වූ අය කරන ලද කුලී ආදායම් බද්ද මෙම වසරේ ක්‍රියාත්මක නොකිරීමට ද රජය තීරණය කර තිබෙනවා. මෙම අහිමි වන ආදායම් නැවත ලබා ගැනීම සඳහා ඩිජිටල් සේවා සඳහා වැට් බද්ද හඳුන්වා දීම, සේවා අපනයනය සඳහා සංස්ථාපිත ආදායම් බද්ද පැනවීම සහ සිගරට්/ මත්පැන් සහ ක්‍රීඩා සඳහා සංස්ථාපිත බද්ද වැඩි කිරීම ඇතුළු පියවරයන් රජය දැනටමත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කොට තිබෙනවා.

මෙහි දක්වා ඇති බදු ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මඟින් ශ්‍රී ලංකාවට, 2025 දී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 15.1 ක ආදායම් ඉලක්ක සපුරා ගැනීමට හැකි වන පරිදි, අවශ්‍ය කරන ආදායම ලබා දෙනු ඇතැයි අපේක්ෂා කරනවා. කෙසේ වෙතත්, ඊට සමගාමීව, රජය බදු පරිපාලනය සහ අනුකූලතාව වැඩිදියුණු කිරීම සඳහා ඒකාබද්ධ උත්සාහයන් ගනිමින් සිටී. ඇත්ත වශයෙන්ම, ඉදිරි අය වැය සඳහා ශ්‍රී ලංකාවේ ආදායම් උපායමාර්ගය තුළින් බදු පරිපාලනය ශක්තිමත් කිරීම, අනුකූලතාව වැඩිදියුණු කිරීම, වැඩිදියුණු කළ ඩිජිටල්කරණය සහ දැඩි අධීක්ෂණ යන්ත්‍රණ හරහා ආයතනික ශක්තිය වැඩිදියුණු කිරීම මඟින් රාජ්‍ය මූල්‍ය තිරසරභාවය වැඩිදියුණු කිරීම අරමුණු කරගනු ලබනවා. ඒ සමඟම, සමාජයේ වඩාත්ම අවදානමට ලක්විය හැකි කණ්ඩායම්වලට සහන ලබා දීම ද අපේක්ෂා කරනවා. බදු පරිපාලනයේ මානව අන්තර්ක්‍රියා අවම කරන අතරම, කාන්දු වීම් අඩු කිරීම සහ විනිවිදභාවය වැඩිදියුණු කිරීම සඳහා බදු පද්ධති ඩිජිටල්කරණය කිරීම කෙරෙහි උත්සාහයන් යොමු කිරීමට අපේක්ෂා කරනවා.

ආර්ථිකය විධිමත් කිරීම සහ ආදායම් එකතු කිරීම වැඩිදියුණු කිරීම සඳහා වන පුළුල් ඩිජිටල්කරණ න්‍යාය පත්‍රයේ කොටසක් ලෙස, ශ්‍රී ලංකාව කාසි සහ නෝට්ටු රහිත ආර්ථිකයක් කරා ගමන් කරමින් සිටියි. ඩිජිටල් ගනුදෙනු සඳහා පහසුකම් සැලසීම සහ මුදල් මත යැපීම අඩු කිරීම සඳහා ප්‍රධාන මුලපිරීමක් ලෙස, විශේෂයෙන් වැට් බදු ලියාපදිංචි ව්‍යවසායන් තුළ, ව්‍යාපාර පුරා පොයින්ට්-ඔෆ්-සේල් (PoS) යන්ත්‍ර (POS Machines) භාවිතය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනවා. කාසි සහ නෝට්ටු රහිත ආර්ථිකයක්, බදු පැහැර හැරීම් සහ නීති විරෝධී මූල්‍ය ක්‍රියාකාරකම් මැඩපවත්වනවා පමණක් නොව, ශ්‍රී ලංකාවේ ආර්ථික ස්ථාවරත්වය සහ වර්ධනයට දායක වන මූල්‍ය කාර්යක්ෂමතාව ද වැඩි දියුණු කරනු ඇත.

රාජ්‍ය ආදායම් උත්පාදනය කරන ආයතන ඩිජිටල්කරණය කිරීම සහ සමස්ත ඩිජිටල් ආර්ථිකය, ආදායම් වැඩිදියුණු කිරීමේ උත්සාහයන් සඳහා සැලකිය යුතු ශක්තියක් ලබාදෙනු ඇතැයි අපේක්ෂා කරනවා. කෙසේ වෙතත්, මේ සම්බන්ධයෙන් වගකීමක් ඇත්තේ බදු එකතු කිරීමේ බලධාරීන්ට පමණක් නොවේ. විගණන සමාගම් සහ බදු ගණකාධිකාරීවරුන් ඇතුළු තවත් පාර්ශ්වකරුවන්, රජයට නිසි බදු ආදායම අහිමි නොවන පරිදි සාමාජීය වශයෙන් වගකිවයුතු ආකාරයකින් තම රාජකාරි ඉටු කිරීමේ වගකීමක් ඇත. මේ සම්බන්ධයෙන්, නියාමන සහ නීතිමය රාමුවට අනුකූල වීම සහතික කිරීම සඳහා සුදුසු පියවර ගැනීමට අප අපේක්ෂා කරනවා.

මෙම බදු පරිපාලනය සහ බදු අනුකූලතා වැඩිදියුණු කිරීමේ පියවරයන් තුළින් 2025 න් ඔබ්බට ශ්‍රී ලංකාවට ආදායම් ඉලක්ක ඉක්මවා යාමට හැකිවනු ඇතැයි අප විශ්වාස කරනවා. එම අවස්ථාවේදී, ආදායම් ඉලක්ක සපුරා ගැනීමට හානියක් නොවන ආකාරයෙන් සහ රටේ රාජ්‍ය මූල්‍ය හා ආර්ථික ස්ථාවරත්වය සහතික කරන ආකාරයෙන් මහජනතාවට තවදුරටත් සහන සැලසීමට හැකි වනු ඇත.

**45. ණය ගැනීමේ සීමාව**

2025 මූල්‍ය වර්ෂය සඳහා විසර්ජන පනත් කෙටුම්පත සඳහා ණය ගැනීමේ සීමාව ඇමුණුම II හි ඉදිරිපත් කර තිබෙනවා. අදාළ වියදම් සහ ආදායම් පියවර පිළිබඳ තාක්ෂණික සටහන ඇමුණුම III සහ ඇමුණුම IV හි පිළිවෙළින් දක්වා තිබෙනවා. තවද, 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ අය වැය දෙවන වර කියවීම සමඟ ඉදිරිපත් කළ යුතු ලේඛන ද සභාගත කර තිබෙනවා.

**සමාප්තිය**

මම අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන අය - වැය යෝජනාවලිය ඇතුළත් ප්‍රතිපත්ති අපව මේ තනතුරට පත් කරමින් රටේ ජනතාව අප වෙත තැබූ බලාපොරොත්තුවේ තීරණාත්මක පිළිබිඹුවක් වෙනවා. මේ අය - වැය සහිත ප්‍රතිපත්ති වැඩපිළිවෙළ මගේ හුදකලා ප්‍රයත්නයක් නොවන අතර, සහමුලින්ම සාමූහික උත්සාහයක ප්‍රතිඵලයක් වෙනවා. එය සමස්ත රජයේම අධිෂ්ඨානශීලී කැපවීමක් වෙනවා. අපගේ ආණ්ඩුවේ බොහෝ දෙනෙක් පාර්ලිමේන්තුවට ආගන්තුක වුවත්, ඔවුන් සතුව ඇත්තේ විශාල අත්දැකීම් හා ප්‍රායෝගික දැනුම බව සිහිපත් කළ යුතුයි. මෙම අය - වැය ප්‍රකාශය බිහි වූයේ අපේ රටේ ඉතිහාසය අලුතින් හැඩගැස්වීමේ අවස්ථාවට දායක වූ ඉමහත් කැපවීමක් ඇති, අනුග්‍රහශීලී නිලධාරීන් හා ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ අත්දැකීම්වලින්. ඒ වගේම, තමන්ගේ වෘත්තීය ජීවිතය තුළ කීර්තිමත් වූ, දේශප්‍රේමී වෘත්තිකයින්ගේ ආත්ම විශ්වාසය හා ධෛර්යයෙන්. ඔවුන් ඉතිහාසයේ පළමු වතාවට පිරිසිදු, ක්‍රියාකාරී සහ හෘදයාංගම බවින් පිරි පාලනයකට දායක විය හැකි බව දැඩිව විශ්වාස කරනවා.

ඔබ මෙම රජයේ පෙළගැස්ම දෙස බැලුවහොත්, ඔබට පෙනෙනු ඇත්තේ වඩාත්ම උද්යෝගශීලී හා විනයගරුක දේශපාලකයින් සහ තමන්ගේ වෘත්තීය ජීවිත, පවුල් සමඟ ගත කළ යුතු කාලය හා ව්‍යාපාරික උරුමය පවා තම රට වෙනුවෙන් කැපකළ, වඩාත්ම කීර්තිමත් විද්වතුන් හා වෘත්තිකයින්ගේ මිශ්‍රණයක්. අපි සියලු දෙනා එක්ව, දීර්ඝ අධිෂ්ඨානශීලී ගමනක් ආරම්භ කොට තිබෙනවා.

අපි ජීවන වියදම් අඩු කර තිබෙනවා. අපි අපගේ යුක්තිය පසිඳලීමේ පද්ධතිය පිළිබඳ විශ්වාසය ප්‍රතිස්ථාපනය කිරීම ආරම්භ කර තිබෙනවා. එමෙන්ම, අපි ප්‍රථම වතාවට දූෂණය පමණක් නොව, බලයේ ඉහළ ධූරාවලියෙන් පවා දූෂණයට දක්වන අතරමැදි භූමිකාව පවා අහෝසිකොට තිබෙනවා.

වසර ගණනාවක් තිස්සේ, ශ්‍රී ලංකාවේ ආයෝජනය කිරීමට කැමති අයට යමක් කිරීමට පෙර, අනවශ්‍ය ලෙස අතරමැදියන්ට ආයෝජනය කිරීමට සිදු වුණා. ඒ යුගය අවසන් වී තිබෙනවා. මෙම රජයේ මහජන නියෝජිතයෙකු හෝ පත් කරන ලද කිසිදු නිලධාරියෙකු තම රාජකාරියට මුවාවී අනුග්‍රහ ලෙස අල්ලස් හෝ උපකාර ඉල්ලා සිටින්නේ නැති බවත්, එවැනි අවස්ථාවක් යම් හෙයකින් උදා වුණොත් ඔවුන්ට අපගේ කිසිදු ආරක්ෂාවක් ලැබෙන්නේ නැති බවටත්, ඔවුන්ට එරෙහිව ගතහැකි සියලු ස්වාධීන නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බවටත් සහතික වෙනවා. මෙම රජය කිසිවිටෙකත් තම ගමන තුළ දූෂණයට ඉඩ තබන්නේ නැහැ. දැන් සන්තෝෂම් දිය යුතු අය බිය විය යුතු නැහැ. එහෙත්, සන්තෝෂම් ගැනීමට උත්සාහ කරන්නන් බියවිය යුතුයි.

අපගේ අධිකරණය කිසිවිටෙකත් මින් පෙර මෙතරම් නිදහස් හෝ ස්වාධීන වී නැහැ. අපගේ පොලිස් බළකාය කිසිවිටෙකත් මින් පෙර මෙතරම් බලසම්පන්නව සහ ස්වාධීනව ක්‍රියාත්මක වී නැහැ. ඔවුන් කිසිවෙකුට බිය හෝ පක්ෂපාතීභාවයකින් තොරව නීතිගරුකව සිය ආයතනවල රාජකාරී කරනවා. එහෙත්, ශ්‍රී ලංකාව හැරගිය බොහෝ දෙනා දන්නා පරිදි, දූෂණයට තිත තැබීම යනු යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය බලාත්මක කිරීම පමණක් නොවේ. ඒ සඳහා, රජය ක්‍රියාත්මක වන ආකාරය නවීකරණය කිරීම, රාජ්‍ය යන්ත්‍රණය වඩාත් කාර්යක්ෂමව හා වඩාත් පාරදෘශ්‍යව ක්‍රියාත්මක කිරීම ද කළ යුතුයි. එවිට දූෂණයේ මූලික හේතුව විසඳනු ඇතැයි අප විශ්වාස කරනවා. දූෂණයේ මූලබීජය මෙයින් සහමුලින්ම තුරන් කරන අතර, අල්ලස් දීමට ඇති පෙලඹවීම අධෛර්යමත් වීමද, අල්ලස් ගැනීම තවදුරටත් අසීරු දුෂ්කර කටයුත්තක් වනු ඇති.

ශ්‍රී ලංකාවට නවීන ලෝකය සමඟ ගැළපීමට මෙවන් ස්වර්ණමය අවස්ථාවක් මින් පෙර උදා වී නැහැ. අද මම දකින්නේ එක්සත් ශ්‍රී ලංකාවක්, පිරිසිදු ශ්‍රී ලංකාවක්, සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් තුළින් සෑම දෙනාගේ අපේක්ෂාවන් සඵල කිරීමට ඇති සුවිශේෂී අවස්ථාවයි.

12 පිටුවට ▶